## 171 – දවසක දූවිලි

දවසක දූවිලි පසට හැරේ
පසද ගලට පෙරලේ
දවසක ගලකින් මැණික් සැදේ
දහමේ සිරිත මෙයයි

දූවිල්ලෙන් මැණිකක් සැදේ
මඩෙන් නෙළුම් මතුවේ
බෙලි කටුවෙන් මුතුවක් සැදේ
කටු අග මල් පිබිදේ

එළියෙන් රෑය දවසට පෙරලේ
මැණිකට ගලක් හැරේ
හැම දෙයටම සුභ මොහොතක් ඒ
ඔබටද එය පැමිණේ

අද ගල් බිම හෙට මල් බිම වේ
මල් බිඳු පැණි බිඳු වේ
පැණි බිඳු බිඳු මී වදයක් වේ
සෝබා දහම මෙයයි